බියගම ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බියගම ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට බියගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම.

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
ප්‍රමිතියේ 2 වන පරිච්ඡේදයේ 2.5 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවත්, පෙර වර්ෂයන්ට අදාළව සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබුණු උසාවි දඩ රු.25,447,678 ක් සහ මුද්දර ගාස්තු රු.234,024,043 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.	මෙම ආදායම අපගේ පාලනයකින් තොරව ලැබෙන බැවින් ද නිශ්චිතව ගණනය කළ නොහැකි බැවින්ද මුදල් පදනම මත ගිණුම්ගත කර ඇති බව.	ප්‍රමිතිය අනුව නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.2. ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	ගෙවීමට ඉදිරිපත් නොවූ කර්මාන්ත ණයහිමි වටිනාකම රු.469,678 ක් දේපල පිරියත හා උපකරණ ගිණුම/ කෙරීගෙන යන වැඩ ගිණුම බැර කරනු වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.	2025 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	කර්මාන්ත ණයගැති රු.469,678 ක් පුනරාවර්ථන නොවන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගිණුම හර කරනු වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුම හර කර තිබුණි.	2025 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	රු.228,310 ක් වූ කාර්යාලීය උපකරණ යන්ත්‍ර ලෙස ගිණුම් ගත කර තිබුණි.	2025 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ඈ)	කෙරීගෙන යන වැඩ යටතේ පැවති සමාලෝචිත වර්ෂය තුල නිම කරන ලද රු.4,251,697 ක් ගොඩනැගිලි ගිණුම හර කරනු වෙනුවට සමුච්චිත අරමුදල ගිණුම හර කර තිබුණි. තවද ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කරන ලද රු.1,480,105 ක් නැවත සමුච්චිත අරමුදල හර කර කෙරීගෙන යන වැඩ ගිණුම බැර කර තිබුණි.	2025 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	හෙයියන්තුඩුව උතුර ප්‍රජා ශාලාව ගොඩනැගිලි ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ක්ෂය වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු.415,965 ක් සහ ක්ෂය ගිණුමේ ශේෂය රු.205,350 ක් අඩුවෙන්ද සමුච්චිත අරමුදල් ගිණුමේ ආරම්භක ශේෂය රු.210,615 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි.	2025 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	පෙර වර්ෂයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.626,085 ක වියදම සමුච්චිත අරමුදලට ගලපනවා වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි.	ඉදිරියට මෙවැනි අඩුපාඩු සිදු නොවන ලෙස කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අංක 83(ii)	රීති අනුව සේවක ණය සඳහා වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	අත්තිකාරම් සීමා පැනවීමට කටයුතු කර ඇති බව.	රීති අනුව අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යා යුතුය.

(ආ)	2020 අගෝස්තු 27 දිනැති අංක LGD/09/2019(1) දරන පළාත් පාලන දෙපාර්තමේන්තු (බස්නාහිර) චක්‍රලේඛය ඇමුණුම අංක 01	දේපල පිරියත හා උපකරණ වර්ග 7 ක ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණු අතර, උප කාර්යාලවල වෙනම ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි.	ඉදිරියේදී යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	චක්‍රලේඛය උපදෙස් අනුව කටයුතු කළයුතුය.
(ඇ)	2024 ජනවාරි 10 දිනැති අංක 1/2024 දරණ ජාතික අයවැය චක්‍රලේඛයේ 4.3 ඡේදය	පූර්ව අනුමැතියකින් තොරව මාසික කුලී පදනම මත වාහන 12 ක් ලබා ගෙන රු.22,260,191 ක් ගෙවා තිබුණි.	කුලී පදනම මත ලියාපදිංචි මිල ගණන් යටතේ රථ 12 ක සේවය 2024 වර්ෂයේදී ලබා ගෙන ඇති බව.	චක්‍රලේඛය උපදෙස් අනුව කටයුතු කළයුතුය.

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.144,345,586 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.201,645,061 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරිය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
(i)	වරිපනම් හා බදු	80,462	81,477	84,873	68,333	78,937	81,142	85,082	68,915
(ii)	කුලී	7,747	10,506	10,110	12,049	8,188	7,024	6,382	11,653
(iii)	බලපත්‍ර ගාස්තු	5,837	6,255	6,255	-	6,145	6,314	51,718	-
(iv)	වෙනත් ආදායම්	34,032	44,858	44,858	-	36,191	48,616	48,616	-
		128,078	143,096	146,096	80,382	129,461	143,096	191,798	80,568

2.2.2 **ආදායම් රැස්කිරීමේ** කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වරිපනම් හා බදු		
(i)	2024 ජනවාරි 01 දිනට හිඟ හිටි වරිපනම් හා බදු ශේෂය රු.68,915,184 කින් 2025 අප්‍රේල් 08 දින වන විට අයකළ වටිනාකම රු.27,985,831 ක් වූයෙන් හිඟයෙන් අයකළ ප්‍රමාණය සියයට 40 ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.	හිඟ ආදායම් අය කිරීම 2025 වර්ෂය තුල ක්‍රියාත්මක කරමින් පවතින බව.	හිඟහිටි වරිපනම් බදු අදායම කඩිනමින් අය කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වරිපනම් හා බදු ශේෂය රු.68,333,229 ක් වූ අතර, එයින් සියයට 22 ක් හෙවත් රු.14,841,775 ක් වසර 10 ට වැඩි කාලයක්ද, රු.19,532,340 ක් හෙවත් සියයට 29 ක් වූ වසර 5 ත් 10 ත් අතර කාලයක්ද, රු.10,924,900 ක් හෙවත් සියයට 16 ක් වසර 3 ත් 5 ත් අතර කාලයක්ද, හිඟ හිටව පැවතුණි.	හිඟ ආදායම් අය කිරීම 2025 වර්ෂය තුල ක්‍රියාත්මක කරමින් පවතින බව.	හිඟහිටි වරිපනම් බදු අදායම කඩිනමින් අය කළ යුතුය.
(ආ)	කුලී		
	සමාලෝචිත වර්ෂය අවසන් වන විට හිඟ වෙළඳ ස්ථාන කුලී වටිනාකම රු.11,085,550 ක් වී තිබුණු අතර, මුළු හිඟයෙන් සියයට 95 ක් හෙවත් රු.10,551,782 ක් වසර 10 ට වඩා පැරණි ශේෂ වී තිබුණි.	නඩු දමා ඇති කඩ සම්බන්ධයෙන් අධිකරණ තීන්දුව මත ක්‍රියාමාර්ග ගනු ලබන අතර, මුද්‍රා තබා ඇති කඩ කාමර 05 ක හිමිකරුවන් ලිපිනයන්හි නොමැති වීමෙන් අය කර ගැනීමට නොහැකි වී ඇති බව.	හිඟ කුලී ආදායම අප්‍රමාදීව අය කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය වන විට ලැබී තිබුණු මහජන පැමිණිලි 322 කින් පැමිණිලි 160 ක් සඳහා විසඳීම් ලබා දී නොතිබුණි.	පැමිණිලි විසඳීමට කාලයක් ගතවන බව.	මහජන පැමිණිලි විසඳා ඵලදායී සේවාවන් සැපයීමට ක්‍රියා කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය සභාවේ 2024 සිට 2027 දක්වා වූ සිව් වාර්ෂික සැලැස්ම අනුව රු.1,200,000 ක් වැයකර දිරන කසල භාවිතයෙන් පොහොර නිෂ්පාදනය සඳහා ද විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීමට ටෙන්ඩර් පටිපාටිය අනුව ආයතනයක් තෝරාගැනීම සඳහා ද සැලසුම් කර තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	කොම්පෝස්ට් අංගනයක් නොමැති බැවින් කොම්පෝස්ට් නිෂ්පාදනය කළ නොහැකි අතර විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කිරීම අබලි ද්‍රව්‍ය එකතු කරන්නන් විසින් සිදු කරන බව.	අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා ගෙන ඒවා ලඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේදී රු.10,033,996 ක් වැයකර දෙල්ගොඩ කසලාංගණය සංවර්ධනය කර තිබුණද එය භාවිතයට ගෙන නොතිබුණි.	ඉතුරු කොටස සම්පූර්ණ කර ගැනීමට පළාත් සභා ප්‍රතිපාදන ඉල්ලා ඇති බව.	කසල අංගනය භාවිතයට ගෙන කසළ කළමනාකරණය විධිමත් කළ යුතුය.

3.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට 2000 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා තැන්පත් කරන ලද රු.795,947 ක ගෙවල් කුලී තැන්පතු 778 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ගිණුම සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛන නිවැරදි බව.	තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	වසර ගණනාවක සිට ගෙවීමට පැවති එකතුකළ අගය මත බදු ගිණුමේ ශේෂය රු.3,425,043 ක් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.	ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව.	ගෙවීමට ඇති ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.3. නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයුර්වේද ගොඩනැගිල්ල නවීකරණය සඳහා 2023 වර්ෂය දක්වා ප්‍රාදේශීය සභා අරමුදලින් රු.38,750,057 ක් වැයකර ඉදි කිරීම් ආරම්භ කර වසර 04 ක් ගතවී තිබුණද, 2025 ජනවාරි 29 දිනය වන විටත් අරමුණුගත කාර්‍ය සඳහා භාවිතයට ගෙන නොතිබුණි.	වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානයකට සැලසුම් කළ නමුත් වෙනත් සුභ සාධන වැඩසටහන් ආරම්භ කර ඇති බව.	සැලැස්ම අනුව කටයුතු කර අරමුණු ගත කාර්‍ය සඳහා භාවිතයට ගත යුතුය.

(ආ)	රු.3,000,000 ක් වැය කර 2001 වර්ෂයේ ඉදිකල පට්ටිවිල ප්‍රජා ශාලා ගොඩනැගිල්ලේ බිම් මහල පමණක් ඉදි කර තිබීම හේතුවෙන් ස්ලැබ් එක තුලින් පහත මාලයට ජලය කාන්දු වී ගොඩනැගිල්ල හා මාතෘ සායනයට භාවිතා කරන ගෘහ භාණ්ඩ දිරා පත් වී තිබුණි.	තත්ත්ව පරීක්ෂණ වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය දැනුවත් කිරීමටත් කටයුතු කරන බව.	සභාව සතු වත්කම් උපරිම කාර්යක්ෂමව භාවිතයට ගත යුතුය.
(ඇ)	වටිනාකම රු.1,500,000 ක් වූ මීගහවත්ත ගල්හේන පාර ප්‍රජා ශාලාවේ පහත මාලය පමණක් නිම කර තිබුණු අතර ස්ලැබ් වහලය මතට ගසක් කඩා වැටීම නිසා සිදු වී ඇති හානිය යතා තත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී පිළිසකර කරන බව.	සභාව සතු වත්කම් උපරිම කාර්යක්ෂමව භාවිතයට ගත යුතුය.
(ඈ)	වටිනාකම රු.100,000 ක් වූ ඉහල බියන්විල පැෂන්වත්ත ප්‍රජා ශාලාව භාවිතා නොකරන බැවින් වල් බිහිවී විනාශ වී ඇති බව සහ විවිධ අපචාර කටයුතු සඳහා භාවිතා වන බව නිරීක්ෂණය විය.	ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	සභාව සතු වත්කම් උපරිම කාර්යක්ෂමව භාවිතයට ගත යුතුය.
(ඉ)	බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා 2002 වර්ෂයේ ආරම්භ කර 2025 වර්ෂය වන විට ඉදිකිරීම අවසන්කර තිබුණද, වටිනාකම රු.479,094,500 ක් වූ ලී බඩු හා සවි කිරීම් සහිත ගොඩනැගිල්ල, 2025 ජූනි 18 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. මෙම ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ අයිතියද පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.	ඉඩම ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ඇති අතර ගොඩනැගිල්ල ඵලදායී කාර්යයක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව.	වත්කම්වල අයිතිය පවරා ගැනීමට සහ භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	2018 වර්ෂයේදී රු.1,025,000 ක වටිනාකමකට මිලදීගත් ගලි බවුසරය 2020 වර්ෂයෙන් පසුව භාවිතා කර නොතිබුණි.	සාධාරණ ගාස්තුවක් නියම කර සේවාව ලබා දීමට නඩත්තු කටයුතු සඳහා යොමු කර ඇති බව.	වත්කම් උපරිම කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය.
(උ)	2017 වර්ෂයේ සිට අක්‍රියව පැවති රු.200,000 ක් වූ ට්‍රැක්ටරය සමාලෝචිත වර්ෂයේදී අළුත්වැඩියාවට යොමු කර තිබුණද, නිම කර භාවිතයට යොදා ගෙන නොතිබුණි.	අලුත්වැඩියාව සිදු කර කසල කළමනාකරණයට යොදා ගන්නා බව.	සභාව සතු වත්කම් උපරිම කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය.
(ඌ)	2024 වර්ෂයේ වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව වටිනාකම රු.2,105,000 ක් වූ නාන ළිං 9 ක් වැසී ගොස් ඇති බවත්, වටිනාකම රු.4,139,400 ක් වූ නාන ළිං 26 ක් භාවිතයේ නොතිබුණු බවත් නිරීක්ෂණය විය.	ළිං පවතින ස්ථාන හඳුනාගැනීමට නොහැකි වී ඇති අතර, ළිං භාවිතයට ගන්නා ලෙස දැනුවත් කර ඇති බව.	සභාව සතු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර භාවිතයට ගැනීමට ක්‍රියා කළ යුතුය.

3.4. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංවර්ධන නිලධාරීන් 16 ක්, 25/2014 හා 29/2019 චක්‍රලේඛ අනුව බඳවාගත් පෙර පාසල් ගුරු තනතුරු 02 ක්, සහ කම්කරු තනතුරු 16 ක් අතිරික්ත වී තිබුණි.	සංවර්ධන නිලධාරීන් 16 ක් ද 25/2014 හා 29/2019 චක්‍රලේඛ අනුව බඳවාගත් පෙර පාසල් ගුරු තනතුරු 02 ක් ද කම්කරු තනතුරු 16 ක් ද අතිරික්ත ලෙස පෙන්නුම් කරන බව.	අතිරික්ත තනතුරු අනුමත කර ගෙන මානව සම්පත් ඵලදායීව යෙදීමට ක්‍රියා කළ යුතුය.
(ආ)	2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුල සේවය අතහැර ගිය, විශ්‍රාම ගිය සහ මිය ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් රු.1,442,440 ක් අයවීම හිඟ හිටව පැවතුණි.	අය කරගැනීමට කටයුතු කරන බව.	හිඟ සේවක ණය ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය.

3.5. වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු වටිනාකම රු.8,500,000 ක් වූ රූඩ් 01 පර්චස් 33.5 ක් ඉඩමෙහි ස්ථිර නිවාස 5 ක් ඉදි කර තිබුණු අතර, ඉන් නිවාස 03 ක් නිවාස යෝජනා ක්‍රමයක් යටතේ කුලී පදනම මත ලබා දී තිබුණි. එම ඉඩම්වල අයිතිය නිරවුල් කර නොතිබුණු අතර, ඉතිරි නිවාස 02 හි සන්තකය ආපසු ලබාගන්නා ලෙස පලාත් පාලන සහකාර කොමසාරිස් (ගම්පහ) විසින් 2023 ජනවාරි 03 දින කරන ලද දැනුම්දීම 2025 මාර්තු 22 දින වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.	නිවාස 2 හි සන්තකය පවරා ගැනීමට සියලු මන්ත්‍රීවරුන් ඒකමතිකව ප්‍රතික්ෂේප කරන ලද බැවින් ඉදිරියේදී නව සභාව යටතේ ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව.	වත්කම්වල අයිතිය සහ ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.
(ආ)	වත්කම් සමීක්ෂණ මණ්ඩලය විසින් රු.14,247,458 ක් වූ ගොඩනැගිලි 4 ක් හඳුනාගෙන නොතිබුණු අතර රු.500,000 ක් වූ ගොඩනැගිල්ලක් භෞතිකව හඳුනා ගැනීමට තොරතුරු සභාව සතුව නොතිබුණි.	සමීක්ෂණයට බඳුන් වී නොමැති ගොඩනැගිලි ඉදිරියේදී නිවැරදි කිරීමටත් කටයුතු කරන බව	වත්කම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	එකතුව රු.1,000,000 ක් වූ ගොඩනැගිලි 2 ක හිමිකාරීත්වය නිරවුල් කර ගෙන නොතිබුණි.	පරීක්ෂා කර තීරණය කරන බව.	වත්කම් හඳුනාගෙන වත්කම්වල අයිතිය සහ ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.

(ඇ)	1995 වර්ෂයේ ලැබී තිබුණු රු.500,000 ක් වූ ට්‍රැක්ටරය සභාවට පවරාගැනීමට කටයුතුකර නොතිබුණි.	පැවරුම් සම්බන්ධ ලේඛන සොයා ගත නොහැකි වූ බැවින් පවරා ගැනීම් කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති බව.	වත්කම්වල අයිතිය පවරා ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ඉ)	රු.3,997,856 ක පිරිවැයක් දරා ඉදි කළ ප්‍රජා ශාලාවේ ඉහල මාලය ජනෙල් දොරවල් සවිකර, බිම සකස් කර නොතිබුණු බැවින් භාවිතයට ගෙන නොතිබුණි.	ඇස්තමේන්තු සකසා ගම්පහ පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු වෙත යොමු කර ඇති බව.	වත්කම් උපරිම කාර්යක්ෂමව උපයෝජනයට ක්‍රියා කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සිව් වාර්ෂික සැලසුම අනුව සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 17.05 ක් වූ වැඩසටහන් 06 ක් ක්‍රියාත්මක කිරීමටත්, ප්‍රජා මණ්ඩල 07 ක් ප්‍රතිසංවිධානය කිරීමටත්, මාර්ගගත ක්‍රමය ඔස්සේ වරිපනම් ගෙවීමට සැලසීම සියයට 30 කින් නිම කිරීමටත්, හඳුනාගත නොහැකි වත්කම්වලින් සියයට 30 ක් හඳුනා ගැනීමටත් සැලසුම් කර තිබුණත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	පිරිවිතර ලබා ගැනීමට නොහැකිවීම, මහජන සහභාගිත්වය අවම වීම, ප්‍රජා මණ්ඩල ප්‍රතිසංවිධාන කටයුතු සිදුනොවීම, නව ප්‍රජා මණ්ඩල පිහිටුවීම සිදු නොවීම, අනුමත සැලැස්මක් නොතිබීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව.	ලගා කර ගැනීමට හැකි ආකාරයට සැලසුම් සකස් කර ඒ අනුව ඉලක්ක පිහිටුවා ලගා කර ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ආ)	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රතිපාදන මුදල රු.මිලියන 24.55 ක් වූ ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	ප්‍රතිපාදන වෙන් කර නොමැති වීම, අයහපත් කාලගුණය, පාසල් නිවාඩු කාලය වෙනස් වීම, ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් මතු නොවීම සහ ප්‍රතිපාදන ඉතිරිවීම වැනි හේතු මත ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි වූ බව.	සැලසුම ලගා කර ගැනීමට ඇති ආකාරයට සැලසුම් සකස් කර ඒ අනුව ඉලක්ක පිහිටුවා ලගා කර ගැනීමට ක්‍රියා කළ යුතුය.